City NEWS
MINISTRY OF URBAN DEVELOPMENT AND HOUSING
කලාපය 01
2022 නොවැම්බර් 15

# තාවකාලිකව පසුබෑමකට ලක්ව ඇති

# නිවාස ව්‍යාපෘති, ණය හා ආධාර

# වැඩසටහන් ලබන ජනවාරි සිට කඩිනම් කෙරේ...



## අලුතින් නව ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර දැනට ආරම්භ කර ඇති ව්‍යාපෘති අවසන් කරන්න යැයි විෂයභාර ඇමතිවරයාගෙන් උපදෙස්....

ආර්ථික අර්බුදය නිසා තාවකාලිකව පසුබෑමකට ලක්ව ඇති ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘති හා නිවාස ණය හා ආධාර වැඩසටහන් ලබන ජනවාරි මාසයේ සිට කඩිනම් කෙරේ. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට උපදෙස් දෙයි.

නව නිවාස ව්‍යාපෘති හා ආධාර, ණය වැඩසටහන් අලුතින් ආරම්භ කිරීමට පෙර දැනට ආරම්භ කර ඇති නිවාස ණය හා ආධාර වැඩසටහන් අවසන් කරන ලෙසද අධිකාරියේ සභාපතිවරයාට ඇමතිවරයා වැඩිදුරටත් උපදෙස් දුන්නේය.

ඇමතිවරයා මෙම උපදෙස් ලබා දුන්නේ මන්නාරම, එරුක්කලම්පිට්ටි Zakath Kuwait ගම්මානය ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවට සහභාගී වීමෙන් අනතුරුව මන්නාරම එරුක්කලම්පිට්ටි මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේදී පැවැති සාකච්ඡාවකට සහභාගි වෙමිණි.

P4

## අඩු ආදායම්ලාභී නිවාස 25,000 ක් සඳහා සූර්ය පැනල මඟින් විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියක්...

P7

# ලෝක නගර දින දා කෝට්ටේ කොටු බැම්ම තෙත් බිම් උද්‍යානය ජනතා අයිතියට



කුමන ආණ්ඩුවක් බලයට පත්වුවද ජනතාවට හිතකර ව්‍යාපෘති අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පසුගිය දා පැවසීය.

P2



## "සයිකල් සිකුරාදා" පා පැදියෙන් වැඩට එමු

P2

## ඇසිදෙසි පෙරමග

P4

# කතු වැකිය

ආර්ථිකය බිඳ වැටී සමාජය ගිණියම් වෙමින් තිබෙන මොහොතකි මේ.

මෙම අන්තර්ජාල පුවත්පත ඔබ අතට පත්වන්නේ එවන් මොහොතකය.

සමස්තයක් වශයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය මෙරට පුරවැසියන්ගේ ආර්ථික හා භෞතික සංවර්ධනය වෙනුවෙන් සුවිශේෂී දායකත්වයක් සපයනු ලබයි.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ රජයේ ආර්ථික ප්‍රතිපත්ති සාක්ෂාත් කිරීම වෙනුවෙන් අප අමාත්‍යාංශය කොන්දේසි විරහිතව පෙනී සිටී.

ඒ තුළ හුදී ජන අවශ්‍යතාවයන් වෙනුවෙන් අපට කළ හැකි දේ බොහෝය. පවතින සම්පත් කළමනාකරණය කරගනිමින් සමාජීය වශයෙන් පිළිගත් නව්‍ය හා වාණිජමය නැඹුරුවකින් යුතු නිවාස, නාගරික උද්‍යාන නිර්මාණය කිරීම තුලින් මෙරට ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම වෙනුවෙන් අප අමාත්‍යංශය නිරතුරු අවධානයෙන් යුතුව ක්‍රියාකරයි.

මේ එහි එක් අංශු මාත්‍රයක් පමණි....

දහසක් මල් පිපේවා....

මාධ්‍ය ඒකකය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහළ
සෙත්සිරිපාය
බත්තරමුල්ල

94 11 286 7163

94 11 286 5479

paper.citynews@gmail.com

https://www.smoud.gov.lk/

# "සයිකල් සිකුරාදා - පා පැදියෙන් වැඩට එමු" ඇරඹේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් පරිදි ලෝක නගර දින සැමරුම් උත්සවය නිමිතිකර ගනිමින් "සයිකල් සිකුරාදා - පා පැදියෙන් වැඩට එමු" තේමාව යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරින් පා පැදියෙන් සේවයට පැමිණීමේ වැඩසටහන ආරම්භ කෙරුණි.

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රසාද් රණවීර මහතා, ආයතනයේ සේවකයින් බත්තරමුල්ල පැලවත්ත, බුද්ධදාස මහජන ක්‍රීඩාංගණය ඉදිරිපිට සිට බත්තරමුල්ල සෙත්සිරිපාය පරිශ්‍රය දක්වා පැමිණියහ.

පරිසර හිතකාමී නගරයක් සහ සෞඛ්‍ය සම්පන්න නගරවැසියන් බිහිකිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. තවද මාර්ග තදබදය අවම කිරීම, ප්‍රධාන මාර්ගයට අමතරව නගරයේ ඇති අතුරු මාර්ග ජනතාව අතර ප්‍රචලිත කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

එමෙන්ම පාපැදියෙන් සේවයට වාර්තා කරන සේවක සේවිකාවන් දිරිමත් කිරීම සඳහා පාපැදි මිලදී ගැනීමට මූල්‍යාධාර ලබාදීම, නාගරික සංවර්ධන අධිකාරියේ පාපැදි සංසදයේ සාමාජිකත්වය ලැබීම ඇතුළු තවත් පාපැදියෙන් සේවයට පැමිණෙන සේවකයන්ගේ පාපැදි නතර කිරීමට ආවරණ සහිතව වෙනමම ස්ථානයක් අමාත්‍යංශ පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත. එමෙන්ම එම සේවක සේවිකාවන්ට සනීපාරක්ෂක පහසුකම්ද සලසා තිබේ.

තවද පාපැදියෙන් සේවයට වාර්තා කිරීමේදී එම සේවක සේවිකාවන්ට සැහැල්ලු ඇඳුමකින් සැරසී සේවයට වාර්තා කිරීමට ද අවසරය මෙහිදි හිමිවේ.



# තෙත් බිම් උද්‍යානය ජනතා අයිතියට

එමෙන්ම ඉදිරි වසර 20 -30 ගැන සිතා දැන් වැඩකළ යුතුයැයිද අමාත්‍යවරයා කීවේය.

ලෝක නගර දිනය නිමිත්තෙන් කෝට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය විවෘත කිරීමේ අවස්ථාවට එක්වෙමින් අමාත්‍යවරයා මේ බව සඳහන් කළේය.

අනතුරුව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග හා රාජ්‍ය අමාතත්‍ය තේනුක විදානගමගේ මහත්-වරුන්ගේ ප්‍රධානත්වයෙන් කලුවර හා කරඳ පැළ රෝපණය කිරීමේ වැඩසටහනක්ද බත්තරමුල්ල, සෙත්සිරිපාය පරිශ්‍රයේදී ක්‍රියාත්මක කෙරිණ.

කෝට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය 2018 නොවැම්බර් මාසයේදී ලෝක බැංකු ආධාර මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම තෙත්බිම් උයන ඉදිකර ඇත. ඒ සඳහා රුපියල් මිලියන 400 කට ආසන්න මුදලක් වැය කර තිබේ.

කොටුබැම්ම තෙත්බිම් උද්‍යානයේ සම්පූර්ණ වපසරිය හෙක්ටයාර 14කි. මෙය බැද්දගාන, තෙත්බිම් උද්‍යානයේම දිගුවකි. මෙහිදී සමනලුන්, බත්කූරන්, විවිධ මසුන්, පක්ෂීන්, හඳුන් දිවියා ඇතුළු විවිධ සත්වයන් දැක බලාගත හැකිය.

මෙම තෙත්බිම් උද්‍යානය දිනපතාම පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා මහජනතාව වෙනුවෙන් විවෘත්තව පවතී. මේ සඳහා වැඩිහිටියන් සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 100ක් වන අතර ළමයින් සඳහා ප්‍රවේශපත්‍ර ගාස්තුව රුපියල් 50 කි.

පළමු ප්‍රවේශ පත්‍රය මිලදී ගෙන තෙත්බිම් උද්‍යානයට ඇතුළුවූ අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා අනතුරුව තෙත්බිම් උද්‍යානයේ නිරීක්ෂණ චාරිකද නිරත විය.

ලෝක නගර දිනය නිමිත්තෙන් පැවැති උත්සවයේදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා මෙසේද කීවේය.

"කෝට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය නිර්මාණය කළේ යන්ත්‍රෝපකරණ නොමැතිව මිනිස් ශ්‍රමය භාවිතා කරමිනුයි. පරිසර හිතකාමීව නිර්මාණය කරපු මෙම උද්‍යානය අනාගතයේදී පාසල් දරුවන්ගේ මෙන්ම විශ්ව විද්‍යාල සිසුන්ගේ අධ්‍යයන කටයුතු පහසුකරාවි. ඒ නිසා-මෙය ඉතාම වැදගත් ඒ වගේම වටිනා ව්‍යාපෘතියක්. මේ සඳහා මූල්‍ය පහසුකම් සැපයුවේ ලෝක බැංකුවයි.

අපි ලෝක නගර දිනය සමරන්නේ අපේ රට ආර්ථික, සමාජීය හා දේශපාලනික අර්බුදයකට මුහුණදී සිටින වාතාවරණයකයි. ඒ නිසා ඉතාම සරලව මෙම උත්සවය සංවිධානය කළා. නමුත් මෙය මිලකල නොහැකි ඉතා වටිනා ව්‍යාපෘතියක්. මෙය මීට පෙර තිබූ රජයක් ආරම්භ කරපු ව්‍යාපෘතියක්. කුමන පක්ෂයක් බලයට ආවත්, ඇමතිවරුන් වෙනස් වුනත් ජනතාවට හිතකර මෙවැනි ව්‍යාපෘති නතර නොවිය යුතු බව මම හිතනව. ඒ නිසා මේ ව්‍යාපෘතිය ආරම්භ කළ මට පෙර සිටි ඇමතිවරුන්ට මම මගේ ස්තුතිය පිරිනමනවා.

පසුගිය කාලයේදී කොළඹ,මීතොටමුල්ල කුණු කන්ද කඩාවැටිලා ජීවිත අහිමිවුණා. ඒ වගේම පාරිසරික ප්‍රශ්න ගණනාවකුත් මතුවුණා. එවැනි ඛේදවාචකයන් ඇතිවෙන්නේ නිසි පරිදි නගර සැළසුම් නොකළ නිසයි. නිසිපරිදි සැලසුම්කර නගර නිර්මාණය කිරීමෙන් එවැනි ඛේදවාචකයන් වළක්වාගත හැකියි.

මේ වනවිට ලෝකයේ ග්‍රාමීය ප්‍රදේශ අඩුවෙලා නාගරික ප්‍රදේශ වැඩිවෙමින් තිබෙනවා. ඒ අනුව 2050 වසර වනවිට ලෝක ජනගහණයෙන් සියයට 70 වැඩි පිරිසක් නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වෙයි කියල විශේෂඥයන් මත පළකරනවා. ඒ සඳහා සුදුසුවන පරිදි නගරය සූදානම් කිරීම අපේ වගකීමයි. ඉදිරි අවුරුදු 20 -30 ගැන හිතල අපි දැන් වැඩකරන්න ඕන. සියලුම රාජ්‍ය ආයතන සම්බන්-දකරගනිමින් ඒ සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සැකසිය යුතුයි. ඉදිරි කාලයේදී අපි නාගරික සැලසුම් කිහිපයක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට සූදානම් වෙනවා. ඒ අනුව කොළඹ නගර පමණක් නෙවෙයි තවත් නගර සැලසුම් සහගතව සංවර්ධනය කරන්න අපිට පුළුවන් වේවි. මෙවැනි වැඩ කිරීමේදී විවිධ පුද්ගලයන්ගෙන් නොයෙකුත් බලපෑම් එල්ල වෙනවා. නිවරදි දේවල්වලට මම කවදාවත් දේශපාලනික බලපෑම් සිදුකරන්නේ නැහැ . ඒ නිසා තම අමාත්‍යංශයේ නිළධාරීන්ට බලපෑම්වලට යටත් නොවී නිවරදි දේ වෙනුවෙන් කැපවී වැඩ කිරීමට හැකියාව ලැබී ඇතැයිද අමාත්‍යවරයා සඳහන් කළේය."

3 October 2022
World Habitat Day
Mind the gap

# ලෝක ජනාවාස දිනය

"වෙනසක් නොකරමු, කිසිවකු හෝ කිසි තැනක් අත්නොහැර රැකගනිමු" 2022

#WorldHabitatDay

ලෝක ජනාවස දිනය අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන්, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා ඇතුළු මැති ඇමතිවරුන්ගේ සහභාගීත්වයෙන් ඔක්තෝබර් මස 03 වනදා අරලියගහ මන්දිරයේදී පැවැත්විණි.

1986 වසරේ සිට සෑම වසරකම ඔක්තෝබර් මස පළමු සඳුදා ලෝක ජනාවාස දිනය ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. ඒ අනුව මෙවර සමරනු ලැබුවේ 36 වැනි ලෝක ජනාවාස දිනය යි. මෙවර ලෝක ජනාවාස දිනයේ තේමාව වූයේ වෙනසක් නොකරමු, කිසිවකු හෝ කිසිතැනක් අත්නොහැර රැකගනිමු යන්නයි.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් තට්ටු නිවාස හිමියන්ට හිමිකම් ඔප්පු ලබා දීම කඩිනම් කරන බව සදහන් කළ අතර ඒ අනුව මෙවර ලෝක ජනාවාස දිනයට සමගාමීව මහල් නිවාස හිමියන් 650 දෙනෙකු සඳහා හිමිකම් ඔප්පු ලබා දීම මෙහිදී සිදු කෙරිණි.

එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ මහලේකම්වරයාගේ පණිවිඩය එහි මෙරට ප්‍රධානී ලක්ෂ්මන් පෙරේරා මහතා විසින් මෙහිදී සභාවට ඉදිරිපත් කළේය.

නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය ඇමැතිවරුන්වන තේනුක විදානගමගේ හා අරුන්දික ප්‍රනාන්දු, රාජ්‍ය අමාත්‍යවරුන් වන සනත් නිශාන්ත, රෝහණ දිසානායක, කාදර් මස්තාන්, අමාත්‍යාංශ ලේකම් ප්‍රදීප් රත්නායක, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපති ප්‍රියන්ත රත්නායක, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් පෙරේරා, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජීව් සූරියාරච්චි, සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති නීතිඥ සරණ කරුණාරත්න යන මහත්ම මහත්මීන් ඇතුළු නිලධාරීන් පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.














# ඇසිදසි පෙරමග

**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයට**
**අයත් ආයතනවල ප්‍රගතිය පිළිබඳව**
**මාධ්‍ය ප්‍රධානීන් දැනුවත් කිරීමට**
**බත්තරමුල්ල, සුහුරුපායේ පිහිටි**
**අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී**
**සූම් තාක්ෂණය ඔස්සේ පැවති සාකච්ඡාව.**

## රට ආර්ථික අර්බුදයකට මුහුණදී සිටිය ද ජනතාවට නිවාස ලබාදීමේ වැඩපිළිවෙල ඉදිරියටත් ක්‍රියාත්මක කෙරේ..

රට ආර්ථික අර්බුදයකට මුහුණදී සිටියද ජනතාවට සුවපහසු නිවසක් ලබාදීම සහ හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩපිළිවෙල අඛණ්ඩව ඉදිරියටත් ක්‍රියාත්මක කරන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම් ප්‍රදීප් රත්නායක මහතා පැවසීය. ඒ අනුව ඉදිරි වසර දෙක ඇතුලත නිවාස හිමිකම් ඔප්පු 30,000 ක් ලබාදීමේ වැඩසටහන නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් මත දැනටමත් ආරම්භ කර ඇතැයිද හෙතෙම සඳහන් කළේය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශයේ ලේකම් ප්‍රදීප් රත්නායක මහතා මෙසේද පැවසීය. පසුගිය කාලේ රටේ තිබුණු ආර්ථික අර්බුද නිසා නිවාස ඉදිකිරීමේ කටයුතු යම් පසුබෑමකට ලක්වුණා. නමුත් මේ වනවිට පවතින ආර්ථික අර්බුදය ජයග්‍රහණය කරමින් නැවත රට තුළ සංවර්ධන සංග්‍රාමය ආරම්භ කිරීමට රජය සූදානම්. ඒ අනුව අපි නිවාස ව්‍යාපෘති යළි ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටිනවා.

කොළඹ නගරයේ නිවාස නොමැති ජනතාවගේ නිවාස ගැටළුව විසඳීමට තට්ටු නිවාස ලක්ෂ දෙකක් පමණ ඉදිකළ යුතුයි. කුමන අර්බුද පැමිණියද එම ඉලක්කය ජයගැනීම සඳහා නිශ්චිත වැඩපිළිවෙලක් අමාත්‍යංශය දැනටමත් ක්‍රියාත්මක කර තිබෙනවා. එමෙන්ම මේ වනවිට මහා භාණ්ඩාගාරයේ මුදල් මත නාගරික සංවර්ධන ව්‍යාපෘති 260ක් පමණ ආරම්භ කර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරියේ මුදලින් තවත් ව්‍යාපෘති පහක් ආරම්භ කර ඇත.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියට අයත් රජයට පවරා නොගත් ඉඩම්වල හා දැනට ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොමැති හිස් ඉඩම්වල වගා කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව දැනටමත් පන්නිපිටිය, මාදිවෙල වැනි ප්‍රදේශවල හඳුනාගත් එවැනි ඉඩම්වල වගා කටයුතු ආරම්භ කර තිබේ. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය සංවර්ධන බලපත්‍ර අනුමත කිරීම කඩිනම් කිරීම සඳහා (One-Stop Unit,OSU) නමින් සේවා ඒකකයක් හඳුන්වා දීමට නියමිතය. සංවර්ධන බලපත්‍ර අනුමත කරනු ලබන සියලුම ආයතන ඇතුළත් කරමින් මෙම සේවා ඒකකය පිහිටුවීමට නියමිතයි. එමගින් සංවර්ධන බලපත්‍ර අනුමත කිරීමට ගතවන කාලය අවම කිරීම හා සරල කිරීමෙන් වැඩි ආයෝජන ආකර්ෂණය-ක් ලබාගත හැකිවේ යැයි අප බලාපොරොත්තු වෙනවා.

එමෙන්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යංශය යටතේ ශ්‍රී ලංකා දූපත් සංවර්ධන අධිකාරිය නමින් නව ආයතනයක් පිහිටුවීමට ද තීරණය කර තිබෙනවා. එම අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාව වටා පිහිටා ඇති දූපත් සංවර්ධනය කර සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කොට රටට ඩොලර් ගෙන්වා ගැනීමයි.

නාගරික සංවර්ධන හා නිවාස ආමත්‍යංශය යටතේ ඇති ආයතනවල සහයෝගය ලබාගනිමින් ජාතික භෞතික සංවර්ධන සැලැස්ම සකස්කර සියලුම ආයතනවලට ලබාදී තිබේ. එහිදී ලැබෙන අදහස් හා යෝජනා ලබාගනිමින් එම ජාතික භෞතික සැලැස්ම යාවත්කාලීන කර ජාතික භෞතික සංවර්ධන සැලැස්ම සකස් කිරීමට නියමිතය. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට හා ශ්‍රමිකයන්ට ඩොලර්වලට නිවාස අලෙවි කිරීමේ වැඩපිළිවෙල යටතේ දැනටමත් ඩොලර් 40,000කට එක් නිවසක් අලෙවිකර තිබේ. විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට අමතරව විදේශිකයන්ගෙන්ද නිවාස මිලදී ගැනීමට ඉල්ලීම් රැසක් ලැබී ඇත. ඒ අනුව මෙම වසර අවසන්වීමට පෙර ඩොලර්වලට නිවාස අලෙවි කිරීමේ අදාල ඉලක්කය ඉතා පහසුවෙන් ජයගත හැකිවේවි.

එමෙන්ම අඩු ආදායම්ලාභී නිවාස 25,000ක් සඳහා සූර්ය පැනල මගින් විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියක් ඇරඹීමට මේ වනවිට කැබිනට් අනුමැතිය හිමිව තිබෙනවා. එමගින් මෙගාවොට් 500 ක පුනර්ජනනීය බලශක්තියක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂා කරනවා. ඊට අමතරව මාධ්‍යවේදීන්ටත් නිවාස ලබා දීමට අමාත්‍යංශය වැඩපිළිවෙලක් ආරම්භ කර තිබෙනවා යැයිද ලේකම්වරයා වැඩිදුරටත් සඳහන් කළේය.

## නිවාස ව්‍යාපෘති, ණය හා ආධාර

### වැඩසටහන් ලබන ජනවාරි සිට කඩිනම් කෙරේ...

රජයේ අනුග්‍රහය යටතේ 2018 වසරේ සිට මේ දක්වා පවුල් 2,190 කට නිවාස ආධාර ලැබිය යුතු බව දිස්ත්‍රික් ලේකම් ස්ටැන්ලි ද මෙල් මහත්මිය මෙහිදී අමාත්‍යවරයාට පෙන්වා දුන්නාය.

වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය තුළ වුවද මෙම පවුල් 2,190 සඳහා ඉතිරි ආධාර මුදල ලබා දීමට ඉදිරියේදී ප්‍රතිපාදන වෙන් කරන බවද අමාත්‍යවරයා මෙහිදී ප්‍රකාශ කළේය.

ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේ පසුගිය රජයන් විසින් සැලසුමක් නොමැතිව නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මෙවැනි ගැටළු මතුවී ඇති බවයි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2020 වසර සිට මේ දක්වා වූ කාලය තුළ "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ආධාර වැඩසටහන යටතේ නිවාස 23,688 ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඒ සඳහා වෙන් කළ මුදල වන්නේ රුපියල් මිලියන 14,271 කි. මේ වනවිට එයින් නිවාස 15,786 ක වැඩ අවසන් කර ඇත. "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ආධාර වැඩසටහන යටතේ 2020 සහ 2021 වර්ෂ වලදී නව නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 06 ක මුදලක් ලබා දුන් අතර එය 2022 වර්ෂයේ සිට රුපියල් ලක්ෂ 06 හමාරක් දක්වා වැඩි කරන ලදි. එම මුදල ප්‍රතිලාභියාගෙන් නැවත අය කර ගනු නොලබයි.

තවද "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ණය වැඩසටහනද ක්‍රියාත්මක වන අතර ඒ යටතේ 2020 වර්ෂයේ සිට මේ වන තෙක් නිවාස 10,640 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඒ සඳහා වැයවන මුදල ලෙස රුපියල් මිලියන 3,348 කි. මේ වනවිට එයින් නිවාස 10,053 ක වැඩ අවසන් කර ඇත. "ඔබට ගෙයක් - රටට හෙටක්" නිවාස ණය වැඩසටහන යටතේ නව නිවසක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභී පවුලක් සඳහා රුපියල් ලක්ෂ 05 මුදලක් ලබා දෙනු ලබයි. එසේම පවතින නිවාස වැඩිදියුණු කිරීම සඳහා රුපියල් ලක්ෂ 03 ක මුදලක් ප්‍රතිලාභී පවුලක් වෙත ලබා දී ඇත.

"මිහිඳු නිවහන" නිවාස ආධාර වැඩසටහන යටතේ 2020 වසරේ සිට මේ දක්වා වූ කාලය තුලදී නිවාස 835 ක ඉදිකිරීම් ආරම්භ කර ඇත. ඒ සඳහා වැයකළ මුදල වන්නේ රුපියල් මිලියන 394 කි. එයින් නිවාස 412 ක ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් කර ඇත.

අඩු ආදායම්ලාභී පවුල් සඳහා "සෙවණ ආධාර" වැඩසටහන යටතේ නිවාස 94 ක ඉදිකිරීම් ආරම්භ කර ඇති අතර ඒ සඳහා වැයකළ මුදල රුපියල් මිලියන 58 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් 2017, 2018 සහ 2019 යන වසර තුන තුලදී විරුසුමිතුරු නිවාස වැඩසටහන, විශේෂ අවශ්‍යතා සහිත අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන සහ ඉන්දියානු ආධාර වැඩසටහන යන ව්‍යාපෘති තුන යටතේ ඉදිකරමින් පවතින නිවාස සංඛ්‍යාව 3,194 කි. ඒ සඳහා වැයවන මුදල රුපියල් මිලියන 1,284 ක් බවද මෙම සාකච්ඡාවේදී අනාවරණය විය.

සාකච්ඡාවෙන් අනතුරුව ඇමති ප්‍රසන්න රණතුංග මහතා මන්නාරම, එරුක්කලම්පිට්ටි නැගෙනහිර ප්‍රදේශයේ ඉදිවන නිවාස 350 කින් සමන්විත නිවාස ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීම සඳහා ද එහි ගියේය.

මෙම සාකච්ඡාව ග්‍රාමීය ආර්ථික රාජ්‍ය අමාත්‍ය කාදර් මස්තාන්, මන්නාරම දිස්ත්‍රික් ලේකම් ස්ටැන්ලි ද මෙල්, මන්නාරාම ප්‍රාදේශීය ලේකම් මනකරන් ප්‍රතීප්, මන්නාරම ප්‍රාදේශීය සභා සභාපති එම්.අයි. ඉස්සඩීන්, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති රජීව් සූරියආරච්චි මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## දූපත් සංවර්ධන අධිකාරිය නමින් නව ආයතනයක්

රටවටා පිහිටි දූපත් සමූහය සංවර්ධන කර රටේ ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස යොදාගැනීමේ අරමුණින් මෙම නව අධිකාරිය ස්ථාපනය කරන බව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරයි.

ශ්‍රී ලංකා දූපත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා වන කැබිනට් පත්‍රිකාව නුදුරේදීම අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන බවද අමාත්‍යවරයා පවසයි.

අප රට වටා දූපත් 60 කට අධික ප්‍රමාණයක් පිහිටා ඇත. මෙම දූපත් සමූහය සංවර්ධනය කර සංචාරක ආකර්ශනය ඉහළ නංවා ගැනීමෙන් මෙරට ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස යොදාගත හැකි බව ද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරයි.

ලොව බොහෝ රටවල පිහිටි දූපත්වල ආර්ථික විභවතාවයන් ඇගයීමට ලක්වුවද ශ්‍රී ලංකාව වටා පිහිටි කුඩා දූපත්වල ආර්ථික විභවතාවයන් මෙතෙක් නිසි ඇගයීමට ලක්ව නැති බවද හෙතෙම සඳහන් කරයි.

මාලදිවයින වැනි දූපත් රටවල ක්‍රියාත්මක ජල බංගලා වැනි හෝටල් ඉදිකිරීමෙන් දෙස් විදෙස් සංචාරක ආකර්ශණය ඉහළ නැංවිය හැකිවනු ඇතැයිද අමාත්‍යවරයා විශ්වාසය පළ කරයි.

එබැවින් නිසි සැලසුමකට අනුව එම දූපත්වල භෞතික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධන කළ යුතු බවද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පෙන්වා දෙයි. නමුත් අප රටේ මෙතෙක් එවැනි වැඩපිළිවෙළක් ක්‍රියාත්මකව නැතැයිද අමාත්‍යවරයා පවසයි.

වර්තමානයේදී අප රට ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටී. එබැවින් රට වටා පිහිටි දූපත් සංවර්ධන කර ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස යොදාගැනීමෙන් එම අර්බුද වලට විසඳුම් සොයාගත හැකි බවද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා වැඩිදුරටත් සඳහන් කරයි.












# කුරුළු හඬින් ගීතවත් වන්න එන්න බැද්දගානට..

අධික නාගරීකරණයට ලක්වූ බත්තරමුල්ල නගරයේ බැද්දගාන ප්‍රදේශයේ ගස් ගොමු අතරින් පහළට ගලා බසින කුඩා දිය පහරවල් රාශියකි. ඒ අතරින් අපගේ දෙසවන් මත්කරන්නේ නෙක නෙක කරුළු කූජනයයි. ඒ හඬ එකින්එක වෙන්කර හඳුනාගන්නට මා දැරුවේ අසාර්ථක උත්සාහයකි. නොකැළතුණු මඩ ගොහොරු උඩ තැනූ ලී පාලම් මතින් මා පිය නගන්නේ කොළඹ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු සංකීර්ණය ආසන්නයේ පිහිටා ඇති බැද්දගාන wetland park හෙවත් බැද්දගාන තෙත් බිම් උද්‍යානය ඇතුළටය.

කොළඹ 170 - 190 බසයෙන් පැමිණ කෝට්ටේ හන්දියෙන් බැස හෝ එතැනින් වැටී ඇති නිපෝන් මාවතේ සැතපුම් 1 X කින් පමණ මෙහි ළඟා විය හැකියි. එමෙන්ම 168 හෝ 153 බස් රථයෙන් පැමිණ බංගලා හන්දියෙන් බැස බැද්දගාන මාර්ගයේ මීටර් 800 ක් පමණ ආ විට බැද්දගාන තෙත් බිම් උද්‍යානයට ළඟාවිය හැකිය. ඊට අමතරව බත්තරමුල්ල- පොල්දූව පාලම අසලින් වැටී ඇති මාර්ගයෙන්ද මෙයට ප්‍රවේශ විය හැකිය.

දිනපතා උදෑසන 6 සිට පස්වරු 6 දක්වා කුරුලු සහ පරිසර අධ්‍යයන සඳහා පැමිණෙන අයට විවෘත අතර උදෑසන 7 සිට සියලු අමුත්තන් සඳහා විවෘත වේ. ප්‍රවේශපත්‍ර නිකුත් කරන්නේ පස්වරු 5 දක්වා පමණි. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සඳහා පැමිණෙන කණ්ඩායම් කලින් දින වෙන්කර ගත යුතුය.

දේශීය වැඩිහිටි ප්‍රවේශ පත්‍රයක් රුපියල් 100ක් වන අතර ළමා ප්‍රවේශපත්‍රයක මිල රුපියල් 50කි.

මෙම වටිනා තෙත්බිම් පරිසරය සංරක්ෂණය කරමින් එයට සිදුවන හානිය අවම වන පරිදි තිරසාර ලෙස සංවර්ධනය කර උද්‍යානයක් ලෙස පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගැනීම සහ පරිසර අධ්‍යයන කටයුතු සඳහා ඉඩ සැලසීම බැද්දගාන තෙත්බිම් උද්‍යානයේ මූලික අරමුණු අතරවේ. මෙම උද්‍යානයේ සියලු සැලසුම් නිර්මාණය වී ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ සහ වරලත් ගෘහ නිර්මාණ ශිල්පයට අනුකූලවයි. 2016 වසරේ ජුනි 15 වැනිදා මහජනතාව වෙනුවෙන් විවෘත කර නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වන බැද්දගාන තෙත්බිම් උද්‍යානය උද්‍යානය පරිසරවේදීන්ගේ හා විශේෂඥයන්ගේ නිරන්තර අධ්‍යයනයට ලක්වන වටිනා පරිසර පද්ධතියකි.

මඩගොහොරු මත ඉදිකළ නිරීක්ෂණ කුලුණු, ගමන් පථ සහ නිරීක්ෂණ ස්ථානවලින් මෙම තෙත්බිම් පරිසරය මනාව සංරක්ෂණය කර ඇති බව උද්‍යානය තුළට පිවිසෙන ඔබට දැකගත හැකියි. නරඹන්නන්ගේ පහසුව සඳහා උද්‍යානය ප්‍රදේශ 12කට පමණ වෙන්කර තිබෙනවා. ඒ, උද්‍යානයේ එළිමහන් පන්ති පැවැත්විය හැකි ප්‍රදේශය, මඩෙහි ඇවිදින පක්ෂීන් දැකගත හැකි ප්‍රදේශය, සැඟවී පක්ෂීන් නිරීක්ෂණය කළ හැකි ස්ථානය, සමනලුන් ගහන ප්‍රදේශය, ගිමන් හල, පක්ෂි නිරීක්ෂණ කුලුණ, දියවන්නා ඉවුර අසබඩ සක්මන් මාර්ගය, වන සැරි මාවත එම නිසාම විද්‍යාත්මක ගවේශකයන්ට පමණක් නොව පරිසරයේ සුන්දරත්වය විඳීමට කැමති කා හටත් මේ උද්‍යානය අපූරු ස්ථානයක්. වයස් භේදයකින් තොරව පවුලේ සියලු දෙනා සමඟ පැමිණ නැරඹිය හැකි සොඳුරු ස්ථානයක්. විශේෂයෙන් කුඩා දරුවන්ට සතුන් ඇතුළු පරිසරය ගැන දැනුම, අවබෝධය ලබාගත හැකි ස්ථානයක්.

කුරුල්ලන් නැරඹීම සඳහා උදෑසන 6-8 කාලය වඩා සුදුසුයි. කුරුල්ලන් නැරඹීමට යන ඔබ හැකි තරම් නිහඬව ගමන් කිරීම උචිත වන්නේ ශබ්ද නිසා කලබලයට පත්වන කුරුල්ලන් ඔබේ දසුනින් සැඟවී සිටීමට උත්සාහ දරන නිසයි. මුවාවී කුරුල්ලන් නිරීක්ෂණය කිරීමට සහ ඡායාරූප ගත හැකි ස්ථානයකුත් මේ උද්‍යානය සතුයි. කුරුලු තොරතුරු පුවරුවලින් ඔබට කුරුල්ලන් ගැන තොරතුරු රැසක් දැනගත හැකියි.

හෙක්ටයාර් 18ක් පුරා පැතිරී ඇති මේ උද්‍යානයේදී මැයි මස සිට ඔක්තෝබර් මස දක්වා සංචාරක පක්ෂීන්ගේ පැමිණීම දැකගත හැකි වෙයි. මෙහි පක්ෂීන්ට අමතරව සමනලුන් ,බත් කූරන් , අවේනික මත්ස්‍යයින් වර්ග මෙන්ම උභය ජීවීන්ද දැකගත හැකිය.

අනේක විද ප්‍රශ්නයන්ගෙන් හෙම්බත්වූ කයට, සිතට හා මනසට දිව ඔසුවක් වන් මෙම පාරිසරික උද්‍යානය නැරඹීමට ඔබත් එන්න.

මතක ඇතිව පියසටහන් පමණක් ඉතිරිකර - මතකය පමණක් රැගෙන එළියට එන්න. මෙය අනාගතයටත් උරුම වටිනා වස්තුවකි.









# කෝට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය



ලෝක නගර දින සැමරුම නිමිත්තෙන් කොට්ටේ, කොටු-බැම්ම තෙත්බිම් උද්‍යානය නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා විසින් ජනතා අයිතියට පත් කරන ලදී.එ

මෙය 2018 නොවැම්බර් මාසයේදී ලෝක බැංකු ආධාර මත නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම තෙත්බිම් උයන ඉදිකර ඇත. ඒ සඳහා රුපියල් මිලියන 400 කට ආසන්න මුදලක් වැය කර තිබේ.

2018 වසරේ ඔක්තෝබර් 25 වනදා ඩුබායි හි පැවති 13 වන තෙත් බිම් පිළිබඳ රැම්සා සම්මුති සමුළුවේදී කොළඹ නගරය රැම්සා තෙත්බිම් අඩවියක් ලෙස නම් කරනු ලැබිණ.

ඒ අනුව බැද්දගාන තෙත් බිම් උද්‍යානය, දියසරු තෙත් බිම් උද්‍යානය, හීන් ඇළ තෙත් බිම් උද්‍යානය, කොලොන්නාව තෙත් බිම් උද්‍යානය, කෝට්ටේ මාදින්නාගොඩ තෙත් බිම් උද්‍යානය, මුල්ලේරියාව තෙත් බිම් උද්‍යානය, තංලගම තෙත් බිම් උද්‍යානය මෙම රැම්සා තෙත් බිම්වලට අයත් වේ.

විවෘත කරනු ලබන කොට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානයේ සම්පූර්ණ වපසරිය හෙක්ටයාර 14කි. මෙය බැද්දගාන, තෙත්බිම් උද්‍යානයේම දිගුවකි.

කෝට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානයේ මූලික අරමුණ වන්නේ වටිනා තෙත්බිම් පරිසරය සංරක්ෂණය කරමින් එයට සිදුවන හානිය අවම වන පරිදි තිරසාර ලෙස සංවර්ධනය කර උද්‍යානයක් ලෙස පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සඳහා යොදා ගැනීම සහ පරිසර අධ්‍යයන කටයුතු සඳහා ඉඩ සැලසීමයි.

මෙය ජලජ ජීවීන්ට, පක්ෂීන්ට මෙන්ම වෙනත් ක්ෂීරපායී සත්වයන් රැසකට ජීවය ලබා දෙන තෙත් බිමකි. සමනලුන්, බත්කූරන්, විවිධ මසුන්, පක්ෂීන්, හඳුන් දිවියා ඇතුළු විවිධ සත්වයන් මෙහිදී දැක බලාගත හැකි බව නාගරික සංවර්ධන අධිකාරිය පවසයි.

විශ්ව විද්‍යාල සිසුන් සහ පාසල් සිසුන්ට පමණක් නොව පරිසර ලෝලීන්ටද මෙහිදී  සත්ත්වයින්, පක්ෂින් සහ ශාක නිරීක්ෂණය මගින් දැනුම ලබාගත හැකියි. ඒ සඳහා පක්ෂීන් නැරඹීමට ස්ථානයක් ද මෙහි ඉදිකර ඇත. ඇවිදින මං තීරුවක් සහ වාහන නැවතුම් අංගනයක් ද මෙහි පැමිණෙන්-නන් වෙනුවෙන් ඉදිකර තිබේ.

මෙම උද්‍යානයේ සියලු සැලසුම් නිර්මාණය වී ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පයට අනුකූලවයි. මෙහි සියලු  ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් තොරව ඉදිකර තිබීම මෙහි විශේෂත්වයකි.

# කතරගම නව කඩකාමර 34ක් විවෘත කෙරේ

ඔක්තෝබර් මස 31 වෙනිදාට යෙදුන ලෝක නගර දිනය නිමිත්තෙන් කතරගම පූජා භූමි ප්‍රවේශ චතුරස්‍ර පරිශ්‍රයේ ඉදිකළ නව කඩ කාමර 34 ක් විවෘත කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති නිමේෂ් හේරත් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

කතරගම පූජා භූමියේ වෙළදාම් කටයුතු සිදු කරනු ලබන මාල කඩහිමියන් සදහා මෙම කඩ කාමර ලබා දීමට නියමිතය. කඩ කාමරයක විශාලත්වය වර්ග අඩි 120 කි. කඩ කාමරයක් සදහා රුපියල් ලක්ෂ 3 ක මූලික ගෙවීමක් සිදු කළ යුතු අතර අනතුරුව මාසික ගෙවීමක් සිදුකළ යුතුය. මෙම භූමිය තුළ ඉදිකර ඇති මුළු කඩ කාමර ගණන 264 කි.

කතරගම පූජා භූමියේ ප්‍රවේශ චතුරස්‍ර පරිශ්‍රය තුල ඇති කඩ කාමර නිරීක්ෂණය කිරීමටද සභාපතිවරයා එක්වූ අතර එහිදී කඩ හිමියන් සිය ගැටළු  ඉදිරිපත් කරන ලදි. කඩ හිමියන්ගේ ගැටළු පිළිබදව මෙහිදී නිළධාරීන් සමගසාකච්ඡා ඊට කඩිනමින් විසදුම් ලබා දෙන ලෙස උපදෙස් ලබා දුන්නේය.





# සියයට සියයක්ම සූර්ය පැනල මගින්

## බල ගැන්වෙන මෙරට පළමු බෝට්ටු සේවය බත්තරමුල්ල දියත උයනෙන් ඇරඹේ....

කොළඹ නගරයේ දෛනිකව ඇතිවන මහාමාර්ග තදබදයට විසඳුමක් ලෙස බත්තරමුල්ල දියත උයන සහ අග්ගොන හීනටිකුඹුර සිට වැල්ලවත්ත දක්වා සූර්ය පැනල මගින් ක්‍රියාත්මක වන පරිසර හිතකාමී මගී බෝට්ටු සේවාවක් පසුගිය දා ආරම්භ කරනු ලැබීය.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතාගේ උපදෙස් මත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාව සහ ජෙන්සෝ පවර් ටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය ඒකාබද්ධව මෙම පරිසර හිතකාමී මගී බෝට්ටු සේවාව ආරම්භ කර ඇත.

එහිදී අදහස් දක්වමින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කළේ මෙම මගී බෝට්ටු සේවාව සූර්ය පැනල මගින් ක්‍රියාත්මක වන මෙරට පළමු බෝට්ටු සේවාව බවයි .

සූර්ය පැනල මගින් ක්‍රියාත්මක වන බැවින් මෙය සියයට සියයක්ම පරිසර හිතකාමී බවද ඔහු සඳහන් කළේය. එමෙන්ම ඉදිරියේදී කොළඹ නගරයේ අභ්‍යන්තර ජල මාර්ගවල මෙවැනි බෝට්ටු සේවාවන් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව කී - අමාත්‍යවරයා මෙය දෙස් විදෙස් සංචාරක ආකර්ශනයයට හේතුවක් වන බවද සඳහන් කළේය.

සූර්ය පැනල මගින් විදුලිය උත්පාදනය කිරීමෙන් වර්තමානයේ රට මුහුණ දෙන ඉන්ධන ගැටළුවට මෙන්ම විදුලි අර්බුදයටත් විසඳුමක් ලැබෙන බවද අමාත්‍යවරයා වැඩිදුරටත් පැවසීය.

සූර්ය පැනල මගින් ක්‍රියාත්මක වන බැවින් මෙම බෝට්ටු ධාවනයේදී ශබ්දයක් පැන නොනගී. එමෙන්ම ඉන්ධන වැයවීමක්ද සිදු නොවේ. ජලජ සත්වයන්ට මෙන්ම දියත උයන ආශ්‍රිතව සැරිසරන කුරුල්ලන්ගේ ජීවන චක්‍රයට බධාවක් ඇතිවන්නේ ද නැත.

බත්තරමුල්ල දියත උයන සහ හීනටිකුඹුර සිට වැල්ල-වත්තට මෙම බෝට්ටු  මගින් විනාඩි 30ක් ඇතුළත ළඟාවීමට  හැකියාව ඇත.

එමෙන්ම බත්තරමුල්ල සිට  වැල්ලවත්ත දක්වා  එක් පුද්ගලයකුගේ රුපියල් 200ක මුදලක් අයකෙරෙන අතර අග්ගොන, හීනටිකුඹුර සිට වැල්ලවත්ත දක්වා එක් පුද්ගලයකුගෙන් රුපියල් 300ක මුදලක් අය කෙරේ.

දිනපතා කාර්යාල වේලාවන්හිදී මෙම බෝට්ටු සේවය ක්‍රියාත්මක වන අතර එක බෝට්ටුවක පුද්ගලයන් 8 දෙනෙකුට ප්‍රවාහන පහසුකම් සැපයේ.

එමෙන්ම බත්තරමුල්ල හා ඒ අවට රජයේ හා පුද්ගලික කාර්යාල, ගේට්වේ ජාත්‍යන්තර පාසල, නාවල විවෘත විශ්ව විද්‍යාලය, 176, බස් මාර්ගය, 138 සහ 122 බස් මාර්ග, වැල්ලවත්ත දුම්රිය ස්ථානයට මෙම බෝට්ටු සේවය මගින් පහසුවෙන් ළඟාවීමට හැකියාව ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රී නීතීඥ මධුර විතානගේ, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාවේ සභාපති හිරාන් බාලසූරිය,ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නාගරික කොමසාරිස් ශානිකා රණසිංහ යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.





# නාගරික සංවර්ධන අධිකාරියට අයත් නිවාස ඩොලර් වලට අලෙවි කිරීමේ රජයේ වැඩපිළිවෙල යටතේ තවත් නිවාස තුනක් අළෙවිවේ...



## නිවාස තුන විකිණීමේ ආදායම ඇමරිකානු ඩොලර් 143,700 යි...

## තවත් නිවාස 10ක් මිලදී ගැනීමට ඉල්ලුම්පත්...

## වසර අවසන්වන විට ඉලක්කය ඩොලර් ලක්ෂ 5යි...

නාගරික සංවර්ධන අධිකාරියට අයත් නිවාස විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට ඩොලර් වලට අලෙවි කිරීමේ රජයේ වැඩපිළිවෙල යටතේ මේ වනවිට තවත් නිවාස තුනක් අලෙවි වී ඇතැයි නාගරික සංවර්ධන අධිකාරිය කියයි.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරන්නේ ඩුබායි රාජ්‍යයේ ශ්‍රී ලාංකිකයන් දෙදෙනෙකු හා ඇමරිකා එක්සත් ජනපදයේ සිටින ශ්‍රී ලාංකිකයකු ඇමරිකානු ඩොලර් 143,700 ක මුදලක් ගෙවා මෙම නිවාස තුන මිලදී ගෙන ඇති බවයි.

නියමිත ඩොලර් වටිනාකම එකවර ගෙවූ බැවින් ඔවුන්ට 10%ක වට්ටම් දීමනාවක් හිමිව ඇත. ඒ අනුව එම නිවාස තුනෙහි වටිනාකම  රුපියල් මිලියන 57කි.

අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරන්නේ මේ වනවිට තවත් නිවාස දහයක් මිලදී ගැනීමට විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් විසින් අයඳුම්කර ඇතැයිද ඔහු කීවේය.

මෙලෙස ඩොලර්වලින් නිවාස මිලදී ගැනීමට අයඳුම්කර තිබෙන්නේ ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රලියාව, ඩුබායි රාජ්‍යය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, බංගලා-දේශය යන රටවල සිටින ශ්‍රී ලාංකිකයන් පිරිසකි.

මෙලෙස අලෙවී ඇත්තේ පන්නිපිටිය වියත්පුර නිවාස සංකීර්ණය, කොට්ටාව ග්‍රීන් ආර්කේඩ් එපාර්ට්මන්ට් සහ මාලබේ ක්‍රසෙන්ඩෝ  රෙසිඩන්සීස් යන නිවාස සංකීර්ණවල පිහිටි කාමර තුනේ නිවාස දෙකක් හා කාමර දෙකේ නිවාසයකි. නාගරික සංවර්ධන අධිකාරියට අයත් නිවාස ඩොලර්වලට අලෙවි කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපයේ පිහිටි නාගරික සංවර්ධන අධිකරියේ ඊයේ (31) පැවැති සාකච්ඡා-වකදී මේ බව අනාවරණය විය.

විදෙස්ගත ලාංකිකයන් හා ශ්‍රමිකයන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකළ මධ්‍යම ආදායම් නිවාස ඩොලර් මගින් මිල දි ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පියවර ගත්තේ පසුගිය සැප්තැම්බර් මාසයේදීය. එම වැඩපිළිවෙල යටතේ අලෙවි වූ පළමු නිවස ඉකුත් සැප්තැම්බර් මස (27) වැනිදා වියත්පුර නිවාස සංකීර්ණයෙන් මිලදී ගත්තේ ඩුබායි රාජ්‍යයේ සිටින ශ්‍රී ලාංකිකයකු විසිනි. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරන්නේ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් ඩොලර්වලින් නිවාස මිලදී ගැනීමේදී නියමිත මුදල එකවර ගෙවීමේදී 10%ක වට්ටමක් හිමිවන අතර කොටස් වශයෙන් ගෙවීමේදී 5%ක වට්ටමක් හිමිවන බවයි. මෙම වසර අවසන්වීමට පෙර විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් සඳහා නිවාස අලෙවි කිරීමෙන් ඩොලර් ලක්ෂ 5ක ඉලක්කයක්  සපුරාගැනීමට අපේක්ෂා කරන එමෙන්ම ලබන වසර වනවිට ඩොලර් මිලියන 1.5 ක මුදලක් ඉපයීමට අපේක්ෂා කරන බවද හෙතෙම සඳහන් කරයි. නාගරික සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවිය www.uda.gov.lk පිවිසීමෙන් මේ සම්බන්ධව වැඩි විස්තර හා අවශ්‍ය අයඳුම් පත්‍ර ලබාගැනීමට හැකිය.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ 077-7794016 දුරකතනයට ඇමතීමෙන් ද මේ සම්බන්ධව වැඩිවිස්තර ලබාගත හැකි බව නාගරික සංවර්ධන අධිකාරිය සඳහන් කරයි.



# අඩු ආදායම්ලාභී නිවාස 25,000ක් සඳහා  සූර්ය පැනල මගින් විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියක්...

## ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 500 ක පුනර්ජනනීය බලශක්තියක් එක්කෙරේ..

අඩු ආදායම්ලාභී නිවාස 25,000ක් සඳහා  සූර්ය පැනල මගින් විදුලිය ලබාදීමේ ව්‍යාපෘතියක් ඇරඹීමට යයි. එමගින් මෙගාවොට් 500 ක පුනර්ජනනීය බලශක්තිය-ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු  කිරීමට අපේක්ෂා කෙරෙන බවද නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරයි. ඊට අදාළ කැබිනට් පත්‍රිකාවට පසුගියදා අනුමැතියද හිමිවිය.

මේ සඳහා තෝරා ගැනෙන්නේ විවිධ හේතු නිසාවෙ-න් ඉදිකිරීම් කටයුතු අතරමඟ නතරවූ නිවාස 69,000ක් අතුරින් නිවාස 25,000කි. එම නිවාසවල වැඩ අවසන්කොට වහලය මත සවිකෙරෙන සූර්ය පැනල මගින් කිලෝවොට් 20 විදුලියක් උත්පාදනය කෙරෙති. එම විදුලිය නිවාසවල පාවිච්චියට අමතරව ජාතික විදුලිබල පද්ධතියටද එක්කෙරෙන බව අමාත්‍යවරයා පවසයි. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2017 වසරේ සිට අඩු ආදායම්ලාභී පවුල් වෙත ආධාර පදනමින් දියත් කරනු ලැබූ නිවාස ව්‍යාපෘති රැසක් මේ වනවිට විවිධ හේතු මත අතරමඟ නතරව ඇත. ඒ අනුව මොණරාගල, අම්පාර, මඩකළපුව,ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුර, වවුනියාව,මන්නාරම, මුලතිව්, කිලිනොච්චි සහ යාපනය යන දිස්ත්‍රික්ක 11හි ගම්මාන වශයෙන් ආරම්භ කරන ලද අතරමඟ නතරව ඇති තෝරාගත් නිවාස යෝජනා ක්‍රම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. විදේශීය සමාගමක් සමඟ ඒකාබද්ධ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර වසර 20ක් ගතවනතුරු සූර්ය පැනලවල නඩත්තුව ආයෝජකයා විසින් සිදුකරනු ලබන බවද අමාත්‍යවරයා පවසයි. එමෙන්ම මෙම ව්‍යාපෘතියේ පළමු වසර 7 සඳහා විදුලි ඒකකයක් සඳහා ඇමරිකානු ඩොලර් 0.116ක මුදලක් ආයෝජකයා වෙත ගෙවන අතර ඉතිරි වසර 13  සඳහා විදුලි ඒකකයකට ඇමරිකානු ඩොලර් 0.0816 ක් ගෙවනු ලබයි.

මෙම සූර්ය පැනල මගින් විදුලිය ලබාදීමේ ව්‍යාපෘතිය මගින් වසරකට ගිගාවොට් 648ක ප්‍රමාණයක විදුලිය උත්පාදන කෙරේ. එබැවින් මෙරටට ඉන්ධන ආනයනය කිරීමට වසරකට වැයවන මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 116.64ක මුදලක් ඉතිරිවන බවද අමාත්‍යවරයා පවසයි.

මෙම ව්‍යාපෘතියෙන් ගිවිසුම්ගත විසිවසරක කාලය තුළ ඇමරිකානු ඩොලර් මිලියන 2,332.80 විදේශ විනිමය වටිනාකමක් රටට ඉතිරිවන බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි

ඒකකයකට ඇමරිකානු ඩොලර් 0.0816 ක් ගෙවනු ලබයි.

මෙම සූර්ය පැනල මගින් විදුලිය ලබාදීමේ ව්‍යාපෘතිය මගින් වසරකට ගිගාවොට් 648ක ප්‍රමාණයක විදුලිය උත්පාදන කෙරේ. එබැවින් මෙරටට ඉන්ධන ආනයනය කිරීමට වසරකට වැයවන මුදලින් ඇමරිකානු ඩොලර් මිලියන 116.64ක මුදලක් ඉතිරිවන බවද අමාත්‍යවරයා පවසයි.

මෙම ව්‍යාපෘතියෙන් ගිවිසුම්ගත විසිවසරක කාලය තුළ ඇමරිකානු ඩොලර් මිලියන 2,332.80 විදේශ විනිමය වටිනාකමක් රටට ඉතිරිවන බවද අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසයි



# කෝට්ටේ, කොටුබැම්ම තෙත්බිම් උද්‍යානය


















